# රන්මසු උයන - අනුරාධපුරය

රන්මසු උයන (රංමසු උයන) අනුරාධපුරය පූජා භූමිය තුල තිසා වැව හා ඉසුරුමුණිය විහාරයට ආසන්නව පිහිටා ඇති අතර වෙස්සගිරිය පිහිටා ඇත්තේද මෙයට මදක් දුරිනි. ස්වර්ණමය මත්සයන් සිටිනා උයන යන අර්ථය මෙම නමෙහි ගැබ්ව ඇත. රන්මසු උයනට ඉසුරුමුණිය විහාරය තරම් නරඹන්නන් ඇදී එන බවක් දක්නට නොමැත. රන්මසු උයන රාජකීය උයනක් ලෙස සලකනු ලබන අතර එකල එය මගුල් උයන ලෙසද හඳුන්වා ඇත. මහා විහාර භූමියට දකුණු දෙසින් එය ඉදි කරන ලද්දේ ක්‍රි.පූ. 3 වන සියවසේදී දේවානම් පියතිස්ස රජතුමා විසිනි.




රන්මසු උයන




වෙස්සගිරිය

Lak Viskam

ක්‍රි. ව. 10 වන සියවසේදී හතර වන මිහිඳු රජු විසින් වෙස්සගිරියේ පිහිටුවා ඇති සෙල්ලිපියක හා පසුකාලීනව මහාබෝධිවංශ ග්‍රන්ථිපදයේ මෙය රන්මසු උයන ලෙස දක්වා ඇත. හතර වන මිහිඳු රජතුමා ගේ පුවරු ලිපියේ මෙම උද්‍යානයේ විශිෂ්ට ජල කළමනාකරණ සැලසුම පිළිබඳව විස්තරකර ඇත. එනම් තිසා වැවේ ජලය ප්‍රධාන ජල සොරොව්ව හරහා රන්මසු උයන වෙත ගලා ඒමට සලස්වන අතර , කදලී ගෘහය (කෙළ ගෙය), උයන් තෙය (උද්‍යානයේ පොකුණ), මහනෙල් තෙය (මහනෙල් පොකුණ) වෙත ගොස් අවසානයේ ඉසුරුමුණිය විහාරය අසල ඇති වෙල් යායට එකතු වේ. මෙහි පොකුණු තනන ලද්දේ වසභ රජතුමා බවට මතයක් පවතී.







කුඩා ගල් පර්වත

අංග සම්පූර්ණ රාජකීය උද්‍යානයක් වන රන්මසු උයන තුල විශිෂ්ඨ වාස්තු විද්‍යානුකූලව සැකසූ දැකුම්කළු ස්නානාගාර, මහනෙල් මල් පොකුණු, ලතා මණ්ඩප, සකස් කල කඳු, කදලී ගෘහ, මල් පාත්ති, දෝලා මණ්ඩප,

ශෛලමය පියගැට පෙළවල්, ශෛලමය ආසන, මුරගල් ආදිය දක්නට ඇති අතර ගල් පර්වත යා කරමින් ගල් පුවරු යොදා ඒ මත ගොඩනැගිලි ඉදිකිරීමේ ඉතා දියුණු තාක්ෂණයක් උද්‍යානය තුල දක්නට ලැබේ. අක්කර 40ක භූමි භාගයක පැතිරෙන උද්‍යානය ක්‍රි.ව.1901දී එච්. සී. පී. බෙල් මහතා විසින් සොයා ගන්නා තුරු වනාන්තරයෙන් වැසී තිබුණු අතර ක්‍රි. ව. 1940දී සංරක්ෂණ කටයුතු සිදු කොට ඇත. වර්තමානයේ එය පොකුණු හතකින් යුත් පුරාවිද්‍යා රක්ෂිත භූමියක් වේ.




ජල පොකුණ, ධාරා ගෘහය හා ඉහලින් වූ ගඩොල් ගොඩනැගිලි නටබුන්

ජනප්‍රවාදයන්ට අනුව සාලිය කුමරුන්ට අශෝකමාලා හමුවී ඇත්තේ මෙම උද්‍යානයේදීය. අශෝකමාලා විසූ චණ්ඩාලගම (හෙල්ලොලිගම) මේ ආසන්නයේ පිහිටා ඇත. ඉතා ප්‍රසිද්ධ ඉසුරුමුණි පෙම් යුවල කැටයම මුලින්ම ලැබී ඇත්තේ ඉසුරුමුණි විහාරයට නුදුරින් පිහිටි මෙම රන්මසු උයන භූමියෙනි. මේ හේතුවෙන් බොහෝ දුරට මෙම කැටයමෙන් නිරූපණය වන්නේ සාලිය, අසෝකමාලා පෙම් යුවල ලෙස මතයක් පවතී. කෙසේ වෙතත් මේ කැටයම පිලිබඳ විවිධ මත පවතින අතර කැටයමින් නිරූපණය වන්නේ කවුරුන් ද යන්න තවමත් නොවිසඳුණු ගැටලුවකි.

Lak Viskam




ඉසුරුමුණි විහාරය සහ ඉසුරුමුණිය පෙම් යුවල

උයන්බිම පුරා විසිර පවතින නටබුන් අතර දිය අගලකින් වටවූ විවිධ හැඩ සහිත පාදම කිහිපයක් ඇති වාහල්කඩකින් සමන්විත වූ ගොඩනැගිල්ලක් දක්නට ඇත. මෙය සීත මාළිගාවක් වැනි කුඩා

ගොඩනැගිල්ලකි. ස්නානය සඳහා සකස් කරන ලද බවට සැලකෙන අංග සම්පූර්ණ ශෛලමය පොකුණු 2 ක් ඉතා අලංකාර ලෙස සකසා ඇති අතර දකුණු පස පිහිටි පොකුණේ මදක් ඉහලින් ධාරා ගෘහය නම් කාමරයක් ඇත. එහි අභ්‍යන්තරයේ ගල් ආසනයක්ද දක්නට ඇත. තිසා වැවේ සිට භූගත ජලමාතිකා මගින් ගෙන එන ජලය ඉහලින් පිහිටි ගඩොල් ගොඩනැගිල්ලේ පාදම යටින් ධාරා ගෘහය මුදුනත ඇති කුඩා කවුළු තුලින් පහතට ගලා හැලෙන ලෙස සකස්කර තිබී ඇති අතර එය එකල ඉතා චමත්කාර දසුනක් වූ බවට සැක නැත. අනෙක් පොකුණද ධාරා ගෘහයකින් සමන්විත වන අතර පෙර පොකුණ සේම භූගත ජලමාතිකා මගින් ගෙන එන ජලය ඉහලින් පිහිටි ගඩොල් ගොඩනැගිල්ලේ පාදම යටින් ධාරා ගෘහය මුදුනත ඇති කුඩා කවුළු තුලින් පහතට ගලා හැලෙන ලෙස සකස්කර තිබී ඇත. බටහිර දෙසින් දෙපස, පිහිටි ගලේ බිත්ති මත ඉතා අලංකාර ලෙස දිය කෙලින හා පොකුණට බසින හස්ති රාජයන් කිහිප දෙනෙකු කැටයම් කර ඇත.

## **සක්වල චක්‍රය** - විශ්වයට පිවිසෙන දොරටුව?

රන්මසු උයනේ තිසා වැවට මුහුණලා කුඩා ප්‍රමාණයේ ගල් පර්වතයක කොටා ඇති සුවිශේෂී සංකේත සහිත වෘත්තාකාර කැටයම බොහෝ විද්වතුන්ගේ අවධානය දිනා ගෙන ඇත. මෙය සක්වල චක්‍රය, තරු දොරටුව (Star Gate), විශ්ව ද්වාරය, යන නම් වලින් බොහෝ දෙනා හදුන්වතත් එය කුමක්දැයි තවමත් නොවිසඳුණු ගැටලුවකි. මෙය පිළිබඳව අමෙරිකානු අභ්‍යවකාශ පර්යේෂණ (නාසා) ආයතනය ඇතුළු බොහෝ පර්යේෂකයන්ගේ අවධානය යොමු වී ඇත. පැරණි ඊජිප්තුවේ හා බැබිලෝනියාවේ නටබුන් අතරද මීට ආසන්න සංකේත සහිත චක්‍ර දක්නට ලැබෙන බවත් බැබිලෝනියා සටහනේ මෙම ඊජිප්ත්තු හා ලංකා චක්‍ර ගැන සඳහන්ව ඇති බවත් කියති.




සක්වල චක්‍රය හා එහි ඉදිරිපිට ගල් ආසන මත වාඩි වී සිටිනා විට දිස් වන අයුරු

එච්. සී. පී. බෙල් මහතාගේ අදහස වන්නේ මේ බුදු දහමේ දැක්වෙන විශ්වය පිළිබඳ සරල සටහනක් හෝ පෘථිවිය පිළිබඳ සටහනක් යන්නයි. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතය වන්නේ මෙය ජීව සාගරය බවයි. තවත් මතයක් වන්නේ මෙය එකල තිබු යම් ආකාරයක යන්ත්‍රයක් විය හැකි බවයි. ජීවයේ අධ්‍යාත්මික පරිණාමනය මෙමගින් දක්වෙන අතර පිටත රවුමේ ජීවයේ ප්‍රාථමික අවධියද ක්‍රමයෙන් එය විකාශනය වී මධ්‍යයේ ඇති චක්‍ර මගින් නිර්වාණය ද නිරූපනය වන බවට තවත් විද්වත් මතයකි. තවත් කොට්ටාශයක් පවසන්නේ මෙය අනුරාධපුර යුගයෙන් එපිටට දිව යන ඉතිහාසයක් ඇති බවයි. ඔවුන්ගෙන් සමහරක් පවසන්නේ ඊජිප්තුව හා බැබිලෝනියාව සමග පණිවුඩ හුවමාරු කර ගත හැකි තාක්ෂණයක් මෙහි තිබු බවත් අද මෙලෙස ඉතිරිව ඇත්තේ එහි නෂ්ඨාවශේෂයන් බවය. තවත් කොට්ටාශයක් විශ්වාස කරන්නේ මෙය රාවණා යුගයට අයත් යම් රහස්‍ය සටහනක් බවයි.

Lak Viskam







තිසා වැව හා වැව් බැම්ම මතට සක්වල චක්‍ර පර්වතය පෙනෙන අයුරු

මෙම චක්‍රය මුහුණලා සිටින්නේ බටහිර දෙසට එනම් තිසා වැව දෙසට වේ. එය ඉදිරි පස ඇති කළු ගල් තලාවේ වාඩි වීම සඳහා ආසන 4 ක් කොටා සකස් කර ඇත. මෙම ආසන සකස් කර ඇත්තේ කුමකටද? චක්‍රය අරමුණු කරගෙන භාවනායෝගීව සිටීමටද, එසේත් නැත්නම් වෙනත් ස්ථානයක් සමග සම්බන්ධතා පැවැත්වීමටද? මෙම ලියුම්කරුගේ පෞද්ගලික අදහස නම් මෙම සංකේත වලින් කියවෙන දේ නිවැරදිව වටහාගැනීමට හැකිවනු ඇත්තේ අධ්‍යාත්මික මාර්ගයකින් විය යුතුය යන්නයි. එනම් මෙම ආසන වල හිඳ භාවනාවේ යෙදීමෙන් පහල කරගන්නා අවබෝධයකින් විය යුතුය.

Lak Viskam



සක්වල චක්‍ර රූප සටහන

චක්‍රයේ පිටත රවුමේ සංකේත 20ක් ඇති අතර එහි විවිධ ප්‍රමාණ සහ වර්ගවල මත්සායින්, සංඛයන්, කැස්බෑවා, මුහුදු අශ්වයා, කකුළුවා, දියකිඳුරා වැනි සාගරය ආශ්‍රිත ජීවීන් දක්නට ලැබේ. ඇතුල් රවුමේ හරි මැද ලක්ෂායකින් ආරම්භ වී ක්‍රමයෙන් විශාලවන වෘත්ත 7ක් ඇත. ඉහල වම් පසට වන්නට තවත් එවැනිම වෘත්ත 7ක් කුඩා ප්‍රමාණයෙන් කැටයම් කර ඇත. එම වෘත්ත වලට පහලින් මදක් වෙනස් අකාරයේ රටාවක් හා බිම් හතු වැනි කැටයම් දෙකක් ඇත. එම සලකුණු දෙකට පහතින් යම් කිසි ජීවියෙකුගේ වැනි සලකුණක් ඇත. මෙම ලියුම් කරු මෙම ස්ථානයට ගිය දිනයේදී මෙම සලකුණු තුන ආශ්‍රිතව තෙත් ස්වභාවයක් තිබුණු අතර ජලය වැනි දෙයක් ඉතා ස්වල්ප වශයෙන් ගලෙන් පිටට පැමිණෙන ස්වභාවයක් නිරීක්ෂණය කරන ලදී. උඩ සිට පහලට දිවෙන ඍජුකෝනාශ්‍ර හැඩඇති කාමර වැනි කොටු 10ක් තුල තවත් විවිධ සංකේත 27 ක් පමණ මෙම ඇතුල් රවුම තුල ඇත.

මෙම චක්‍රයෙන් කියවෙන දේ නිශ්චිතව සනාථ කරගැනීමට මේ දක්වා නොහැකිවී ඇත. කෙසේ වෙතත් අපගේ අදහස නම් මේ පිලිබඳ හා තවත් වැදගත් නටබුන් මේ අවට පස් තට්ටු වලට යටින් තිබිය හැකි බවයි. ඒවා මතු කර ගතහොත් බොහෝ ගැටළු අනාගතයේදී නිරාකරණ කර ගනු හැකි වනු ඇත. ඊට අදාල පුද්ගලයන්ගේ හා ආයතන වල  අවධානය යොමු වේවා!

***නිශාන් කුලසිංහ විසිනි***

Lak Viskam